
# හොඳ ළමයා



කිනාරා දයාරත්න

# හොඳ ළමයා

කිනාරා දයාරත්න

# හොඳ ළමයා

## කිනාරා දයාරත්න

**සියලුම හිමිකම් ඇවිරිණි**

කතෘගේ අවසරයක් නොමැතිව මෙම ග්‍රන්ථය උපුටා ගැනීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික ආදී කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම, පළ කිරීම, විකාශනය කිරීම, අනුවර්තනය කිරීම සහ ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

**2025.02.08**

**ISBN: 978-624-208-332-2**

# පිදුම

මා හට මෙම කතන්දර පොත ලිවීම සඳහා අවස්ථාව

ලබ දී මාව ගත්කතුවරියක් බවට පත් කිරීමට උනන්දු

කරවූ ගුරුමැණිවරුන්ටද, පියවරුන්ටද, මාගේ

දෙමව්පියන්ට, අත්තාට, අත්තම්මාට,මාමාට සහ

පවුලේ සැමට මගේ පොත ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රට සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිඡ්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී හිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සෙලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

# හොඳ ළමයා



ගයාන් හොඳ ගතිගුණ ඇති දුප්පත් ළමයෙකි. ගයාන්ගේ පියා ඔහුගේ පුංචි කාලයේදීම මියගියේය. එදා සිට ගයාන්ගේ මව කුලී වැඩ කරමින් ලැබෙන මුදල්වලින් ගයාන්ව රැකබලා ගත්තාය. ගයාන් ඉගෙනීමට ඉතා දක්ෂයෙකි. පන්තියේ වාර පරීක්ෂණ වලදී පළමුවන, දෙවන හෝ තෙවන ස්ථාන වල රැඳි සිටියි. ඔහුගේ නිවෙස අසල සිටින බෙනුර ද ඔහුගේම

පන්තියේ ඉගෙන ගන්නා ළමයෙකි. ඔහුගේ දෙමාපියන් ඉතා පොහොසත් අය වෙති. ඒත් බෙනුර ඉගෙනීමට එතරම් දක්ෂ අයෙක් නොවන අතර ඉතා දඩබ්බර අයෙකි.

ඔහු පෙර සිටම ගයාන් සමඟ තරහින් සිටි අතර ගයාන්ට නිතරම කරදර කරයි. ගයාන් හොඳින් ඉගෙන ගන්නා ළමයෙක් නිසා ගයාන් පාසලේ හැමදෙනා අතරම ඉතා ජනප්‍රිය ළමයෙක් විය. බෙනුර ඒ ගැන හරිම තරහින් තමා හිටියෙ. සමහර දවස් වලට බෙනුර ගයාන්ගෙ පොත් හංගනවා, ඒවා ඉරනවා, කුරුටු ගානවා වගේ නරක දේවල් කිරීම පුරුද්දක් කරගෙන සිටියා. ගයාන්ට තිබුණේ පාසල් නිල ඇඳුම් දෙකයි. දවසක් බෙනුර සහ ඔහුගේ යහළුවන් එකතු වී ඒ එක් සුදු කමිසයකට නිල් පාට තීන්ත හලා විනාශ කර දමන ලදී. නමුත් ගයාන් ඒ සෑම දෙයක්ම ඉවසාගෙන සිටියේය.



එදා තද වැසි දිනයකි. පාසැල නිම වී පාසැලේ සිසුන් සැම දෙනාම නිවෙස්වලට යැමට සූදානම් වුණා. බෙනුරගේ සහ ගයාන්ගේ නිවෙස් එක ළඟ ඇති නිසා බෙනුර සහ ගයාන් දෙදෙනාම පාසලේ සිට යන්නෙ එකම පාරෙන්ය. බෙනුර සහ බෙනුරගේ යහළුවෝ කිහිපදෙනෙක් පාර දිගේ යන්න පිටත් වුණා. වැස්ස තිබුණ නිසා කිහිපදෙනෙක් වැසි කබා පැළඳගෙන ද කිහිපදෙනෙක් කුඩ ඉහළාගෙන ද ගියහ. ගයාන්ටද

යන්න තිබුණේ එම පාර දිගේය. ඉතින් ගයාන් ළඟ තිබුණ අබලං කුඩය ඉහළාගෙන බෙනුරලාගෙ පිටුපසින් ටිකක් ඈතින් ගමන් කිරීමට පටන් ගත්තේය.

මේ කුඩා පාර හරහා තරමක විශාල ඇලක් පිහිටා ඇත. මේ ඇලෙන් එගොඩ වීමට ලී දඬු කිහිපයක් යොදා කුඩා පාලමක් ඉදිකර ඇත. දැන් ඇද හැලෙන අධික වර්ෂාව නිසා ඇල දෙගොඩ තලා යන අන්දමට ජලයෙන් පිරී ඇත.

බෙනුර ඈතින් පැමිණෙන ගයාන්ව දුටුවේය. ඒ අවස්ථාවේදී ඔහුගේ සිතට දුෂ්ඨ අදහසක් ඇති විය. එනම් මේ පාලම උඩදී මග හරස් කර ගයාන්ව ඇලට තල්ලු කිරීමටය. මේ ඉතිරිවෙලා තියෙන පාසල් නිල ඇඳුමත් ජරා වෙලා විනාශ වෙලා ගියොත් ගයාන් ආයෙමත් ඉස්කෝලෙ එන්නෙ නැතිවෙයි, එතකොට බෙනුරට ගයාන්ගෙ තැන ගන්න පුළුවන් වෙයි කියල බෙනුර හිතුවා. ඉතින් ඒ බව යාළුවන්ට පවසා මග හරස් කරගෙන පාලම උඩට වී සිටියහ.

ඉතින් ඇතින් එන ගයාන් බෙනුර සහ යහළුවෝ පාලම උඩ සිටින බව දුටුවේය. ගයාන්ට මේ පිළිබඳව පොඩි සැකයක් ඇති වුණ බැවින් ඒ අසලින් යන විට කල්පනාවෙන් යා යුතු යැයි කියා සිතා ගත්තේය.

ගයාන් සෙමින් සෙමින් පාලම මතට පැමිණියේය. ඔහුට ඉබේම පාලමට පහළින් ගලනා සැඩ පහර දැක ගත හැකි විය. ඔහු පාලම මතින් යන විට බෙනුර ගයාන්ව තල්ලු කිරීමට සිතාගෙන ගයාන් දෙසට වේගයෙන් දිව ආවේය. මෙය දුටු ගයාන් එය මග හැරීමට පසෙකට පැන්නේය. එයින් බෙනුරට තමාගේ වේගය පාලනය කර ගැනීමට නොහැකිව ඇලට ඇද වැටුණේය.



මෙය දුටු බෙනුරගේ යහළුවෝ බියවී එතනින් ඉවතට දිවගියහ. ඇලේ වැටුණ බෙනුර උදව් ඉල්ලා කෑ ගසන්නට විය. එය දුටු ගයාන්ට බෙනුර ගැන දුකක් ඇති වූ අතර බෙනුරව බේරා ගතයුතු යැයි සිතුණි. ගයාන් පාසැලේ වැඩ වලට වගේම පිහිනීමටත් ඉතාම දක්ෂයෙකි. ඔහු ඉක්මනට ඇලට පැන පිහිනා ගොස්

බොහොම අමාරුවෙන් තමාගේ ජීවිතය ගැනද නොතකා බෙනුරව බේරාගෙන ගොඩට ආවේය.



ගොඩට ආ බෙනුර තමාගේ යහළුවන් කොයි දැයි කියා විපරම් කර බැලුවේය. ඔවුන් තමාව බේරා ගැනීමට උදව් නොකර පැන ගොස් ඇති බව බෙනුරට

වැටහුණි. තමන් විසින් ගයාන්ට කරදර කරන්නට ගොස් මෙවන් කරදරයකට පත්වුණ අවස්ථාවේදී ජීවිතය ගැන පවා නොසිතා තමාව බේරා ගැනීමට ඉදිරිපත් වුණේ ගයාන් නේද කියා ඔහුට පුදුම සිතුණි. ඉතින් බෙනුරට ගයාන් ගැන ගොඩාක් ලොකු පැහැදීමක් ඇති විය. ඒ වගේම තමාගෙ නරක ක්‍රියාවන් ගැන අවබෝධ විය.

" අනේ ගයාන් ඔබට මෙච්චර දවසක් කළ නරක දේවල් ගැන මට සමාවෙන්න. මට ඔබ ගැන මගේ දෙමාපියන්ට කියන්න ඕන. ඒ නිසා දැන් ගයාන් මාත් එක්ක මගේ ගෙදර යන්න එන්නම ඕනි" යැයි බෙනුර ගයාන්ට කීවේය. ගයාන් එයට අකමැති වුණත් බෙනුරගේ බල කිරීම නිසා ඔහුට යන්නට සිදු විය.

මඩ වතුර සමග තෙත බරිතව පැමිණි ගයාන් සහ බෙනුර දුටු ගෙදර සියලුම දෙනා කුමක් සිදු වුණේ දැයි බෙනුරගෙන් ප්‍රශ්න කළෝය. බෙනුර සිදුවූ සියල්ලම ගෙදර සිටි සියලුම දෙනාට පැහැදිලි කර දුන්නේය.

මෙය ඇසීමෙන් පසු බෙනුරගේ දෙමාපියන් හා ගෙදර අනෙකුත් අයට ගයාන් ගැන ලොකු පැහැදීමක් ඇතිවිය.

"මේ වගේ යහළුවෝ තමා හොඳම යහළුවෝ කරගන්න ඕන" කියා බෙනුරගේ තාත්තා කිවේය. "ඔව් තාත්තේ මින් පසුව මගේ හොඳම යහළුවා ගයාන්" යැයි බෙනුර සතුටින් කීවේය.

ඉන්පසුව ඔවුන් දෙදෙනාම ස්නානය කර හොඳින් පිරිසිදු විය. බෙනුර ගයාන්ට ලස්සන පිරිසිදු අලුත් ඇඳුම් ලබා දුන්නේය. දෙදෙනාම පසුව පවුලේ සැවොම එකට එක්ව දහවල් කෑම කෑවෝය. ගයාන්ට කාලෙකට පසුව හොඳ ආහාර වේලක් බඩට වැටුණ නිසාත්, මින්පසුව බෙනුරගෙන් තමාට හිරිහැර නොවන බව තේරුම්ගත් නිසාත් ගයාන්ගේ සිතට ලොකු සතුටක් දැණුනි.

පසුව බෙනුරගේ යහළුවන්ද වෙච්ච දේ ගැන දුක් විය. බෙනුරට අනතුරක් වූ වෙලාවේ පලා නොගොස් උදව් කිරීමට තිබූ බව තෙරුම් ගත්හ. යහළුවෝ බෙනුරගෙන් සමාව ගත්හ. එහෙත් බෙනුරගේ සිතේ එයාගේ යහළුවන් ගැන තරහක් තිබූ නිසා සමාව

නොදීමට සිතාගෙන සිටි නමුත් ගයාන්ගෙන් ඉගෙන ගත් දෙයින් කා සමඟවත් වෛරයක් තබා නොගතයුතු යැයි සිතා බෙනුර තම යහළුවන්ටද සමාව දුන්නේය.



ඉන් පසුව ගයාන් සහ බෙනුර දෙදෙනාම සහයෝගයෙන් පාසලේ වැඩ කටයුතු කරගෙන සතුටින් හොඳම යහළුවෝ විදිහට කාලය ගත කලහ. බෙනුරගේ දෙමව්පියෝ ගයාන්ගේ ඉගෙනීම් කටයුතු වලට ගොඩාක් උදව් කලහ.

මේ කතාවෙන් ගත හැකි ආදර්ශය වන්නේ කවුරු කොහොම තමන්ට සැළකුවත් තමන් ඒ හැමදෙනාටම යහපත් ආකාරයට සැළකිය යුතු බවයි. යහපත් ගති පැවතුම් වලින් අයහපත් ගතිගුණ ඇති අයව යහපත් ගතිගුණ ඇති අය බවට පත් කළ හැකි බවයි.

**නිමි.**

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔපනැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛන අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමකි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාවය වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමයා බාලිකා විදුහලේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැපකිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්නය නිර්මාණය වීමට හේතුවී ඇතිබව පර්යේෂණාත්මකව සනථ වී ඇත. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත් පොත රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එකව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

2025.02.08



**කිනාරා දයාරත්න**

ISBN: 978-624-208-332-2